ඒ එච් අබේසූරිය

22, පද්මගිරි

කතළුව,

අහංගම.

18/08/2025

අධ්‍යක්ෂ ජනරාල් තුමා,

ජාතික අයවැය දෙපාර්තමේන්තුව,

මුදල් අමාත්‍යාංශය, ලේකම් කාර්යාලය

කොළඹ 01

2026 අයවැය යෝජනා.

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි,

2026 වර්ෂය සඳහා අයවැය යෝජනා මේ සමග ඉදිරිපත් කරමි.

සුදුසු යැයි හැඟෙන යෝජනා ඇතොත් විස්සයි විසි හය අයවැය සඳහා යොමු කරන මෙන් ඉල්ලමි.


ස්තුතියි,

මෙයට විශ්වාසී,

හර්ෂාන් අබේසූරිය

ශ්‍රී ලාංකීය නව නිපැයුම් කරු

0777-9000 60



ගරු කථානායකතුමනි,

13. පළාත් සභා සංශෝධනය.

පළාත් සභා සීමා නිර්ණය කිරීමේ දී සිදු වූ විකෘතීන් නිවැරදි කිරීම සඳහා මැතිවරණ සීමා නිර්ණය කොමිසම වෙත රුපියල් මිලියන දෙකක් වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඒ අනුව රුහුණු මහා කතරගම දේවාලය ඇතුළත් ව, කතරගම, සෙල්ල කතරගම, යාල ප්‍රදේශ දකුණ පළාත් සභාව ට අයත් වන අතර, බෙන්තර ඇල්පිටිය ප්‍රදේශ බස්නාහිර පළාත් සභාවට එකතු වනු ඇත. ඊට අදාළ භෞතික සීමා ස්ථාපනය සඳහා අදාළ මුදල වෙන් වනු ඇත.

ගරු කථානායකතුමනි

1. ඩිජිටල් ගනුදෙනු.

අප රටේ බැංකු පද්ධතිය හරහා සිදු වන ගනුදෙනු සඳහා අය කරනු ලබන ගාස්තුවල විෂමතාවක් දක්නට ලැබෙනවා.

එනම් ATM යන්ත්‍රයක් හරහා මුදල් ආපසු ගැනීමක දී අදාළ බැංකුවේ ගිණුමක් නම් රුපියල් පහක් ද වෙනත් බැංකුවක ගිණුමකින් මුදල් ආපසු ගැනීමක් නම් රුපියල් 25ක් ද, අය කරනු ලබනවා. අදාළ බැංකු කවුන්ටරයෙන් මුදල් ආපසු ගැනීමක දී කිසිදු ගාස්තුවක් අය වන්නේ නැහැ.

එහෙත් ව්‍යාපාරික ස්ථාන වෙත ලබා දෙන කාඩ් පත් ගෙවීම් යන්ත්‍ර මගින් සිදු කරන ගනුදෙනු සඳහා ගනුදෙනුවෙන් 3% දක්වා මුදලක් අය කරනු ලබනවා. ඊට අමතරව අදාල බැංකුව දින දෙකක් දක්වා මුදල් රඳවා ගැනීමක් ද සිදු කරනු ලබනවා.

2025 පළමු කාර්තුව තුළ පමණක් කාඩ් පත් මගින් සිදුවූ ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 423.8 කි. බැංකු ගාස්තුව මධ්‍යස්ථ ව 2% ලෙස ගතහොත් බැංකු ආදායම රුපියල් බිලියන 8.4 කි. (මෙන්න හොරකම් කරපු තැන්)

මෙය ආර්ථික උද්ධමනයට සෘජුව බලපාන සාධකයක්.

2026 ජනවාරි පළ වෙනිදා සිට කාඩ් පත් මගින් සිදු වන ගනුදෙනු සඳහා එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 25/-ක ගාස්තුවක් පමණක් අය කිරීමට නියම කරනවා. දේශීය හා විදේශීය ඩෙබිට් හා ක්‍රෙඩිට් කාඩ් පත් සඳහා මෙම ගාස්තු අදාළ වනු ඇත.

එමගින් ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය වන අතර මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා වැය වන මුදල සියයට 75 කින් අඩු කර ගැනීමට අපේක්ෂා කරනවා.

කාඩ් පේමන්ට් මැෂින් පහසු ගෙවීමේ ක්‍රමයට ව්‍යවසායකයන්ට ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට මා යෝජනා කරනවා. තවද NFC පහසුකම් සහිත ජංගම දුරකථන සඳහා මෙම මෘදුකාංගය නොමිලේ ලබා දීමට මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි

2. රේගු බදු.

සංකීර්ණ ආනයන අපනයන බදු ක්‍රමයක් මෙරට ක්‍රියාත්මක වීම නිසා ගැටලු විශාල ප්‍රමාණයක් නිර්මාණය වී තිබෙනවා. වංචාව හා දූෂණය වරාය වෙළාගෙන තිබෙනවා. නිදහසෙන් පසු මේ දක්වා ම රැගෙන ආ බදු ප්‍රතිපත්ති එලෙසින් ම පවත්වා ගෙන යාමෙන් ජනතාව බලාපොරොත්තු වූ පුනරුදය නිර්මාණය කළ නො හැකි බව මම තරයේ විශ්වාස කරමි. අංශක 360ක වෙනස් වීමක දී අප වෙනස් වී ඇත්තේ එක අංශකයක් පමණි. එබැවින් අප අංශක 180ක වෙනසක් සිදු කළ යුතුයි.

ගරු කථානායකතුමනි,

2026 වර්ෂයේ සිට සරල බදු ප්‍රතිපත්තියක් ගෙන ඒමට මා යෝජනා කරනවා. එනම් භාණ්ඩයේ වටිනාකම මත නොව, භාණ්ඩයේ බර මත බදු අය කිරීමට මා යෝජනා කරනවා. ඒ අනුව සෑම ආනයන හා අපනයන භාණ්ඩ කියෝවක් සඳහා ම රුපියල් 300/-ක් නැතහොත් ගණනයේ පහසුව සඳහා ඇමරිකානු ඩොලර් එකක් (1USD) රේගු ගාස්තු ලෙස අය කිරීමට මා  යෝජනා කරනවා.

එමගින් කසල වැනි භාණ්ඩ ආනයනය හා අපනයනය අධෛර්යමත් වන අතර වඩාත් ගුණාත්මක තත්ත්වයෙන් යුතු භාණ්ඩ ගනුදෙනු වන කේන්ද්‍රස්ථානයක් බවට ලංකාව පත් කිරීම මෙහි ප්‍රමුඛ අරමුණයි.

ලංකාව තුළ රන් සංචිත ඉහළ නැංවීම, කූට ලෙස වාහන එකලස් කිරීම නැවැත්වීම,

භාණ්ඩ නිෂ්කාශනය වේගවත් හා කාර්යක්ෂම කිරීම, රේගු වංචා තුරන් කිරීම , ලංකාව තුළම විවිධ භාණ්ඩ එකලස් කිරීම ප්‍රවර්ධනය, online බාල භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම, වටිනාකමෙන් හා ගුණාත්මක තත්වයෙන් ඉහළ භාණ්ඩ පරිහරණය කරන පොහොසත්, දියුණු රටක් නිර්මාණය කිරීම අපගේ අරමුණයි.

අපනයන රේගු බදු, සෙස් බද්දක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

ගරු කථානායකතුමනි,

3. විදුලි ගාස්තු සංශෝධනය.

1980 දශකයේ දී සකස් කරන ලද ආයතනය අනුව අය කරන විදුලි ගාස්තු ක්‍රමය, ඉතා විකෘති සහ අසාධාරණ ගාස්තු ක්‍රමයක් බව පෙනේ.(මෙය නිර්මාණය කළ ජේ ආර් ජයවර්ධන මහතා සහ ගංගාරාමයේ නාහිමියන් දැන් ජීවතුන් අතර නැත). යම් පුද්ගලයෙක් විදුලි පංකාව නිවසේ දී ක්‍රියාත්මක කරන්නේ නම් එක් ගාස්තුවක් ද, ව්‍යාපාරික ස්ථානයේ දී නම් වෙනත් ගාස්තුවක් ද අය කිරීම සාධාරණ නැත. විදුලිය නිෂ්පාදන පිරිවැය වෙනස් නොවේ.

එම නිසා විදුලි ගාස්තුව ඒකකයක් සඳහා රුපියල් 25/-ක ස්ථිර මිලක් සහ රුපියල් 300/-ක මාසික ස්ථාවර ගාස්තුවක් 2025 ජනවාරි එක සිට ක්‍රියාත්මක වනු ඇත. අඩු ආදායම්ලාභීන් සඳහා සහන විදුලි ගාස්තුවක් හඳුන්වා දී තිබුණ ද විදුලිය මගින් ආරෝපණය කර ගන්නා දුරකථනය සඳහා වැය කරන මාසික මුදල සාපේක්ෂව වැඩි බව නිරීක්ෂණය වේ.

එපමණක් නොව පොදු ස්ථාන සඳහා විදුලිය ආධාර වශයෙන් ලැබෙන මුදල විදුලි ගාස්තුව මෙන් දස ගුණයක් පමණ වන බව ද නිරීක්ෂණය වේ.

විදුලි ඒකකයක් සඳහා ස්ථිර මිලක් අය කිරීම මගින් විදුලි පරිභෝජනය අර පිරිමැසීමෙන් භාවිතා කිරීමට මහජනතාව පෙලඹෙනු ඇතැයි විශ්වාස කරමි.

තවද විදුලි ගාස්තු නො ගෙවීම නිසා විසන්ධි කිරීම් සිදු වන පරිශ්‍ර සඳහා , යළි සම්බන්ධතාව ලබා දීමේ දී, පෙර ගෙවුම් ගාස්තු අය කරන විදුලි මනු සවි කිරීමට යෝජනා කරමි. ස්වකීය කැමැත්තෙන් පෙර ගෙවූ මනු සවි කර ගන්නා පාරිභෝගිකයින් සඳහා ඒකකයට රුපියල් 20/- ගාස්තුවක් සහ රුපියල් 300 ක මාසික ගාස්තුව නිදහස් කිරීමට මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි,

4. දුම්රිය ප්‍රවේශ පත්‍ර.

දුම්රිය සේවය දියුණු කිරීම සඳහා විශාල ප්‍රාග්ධනයක් යෙදවීමට අවශ්‍ය වී ඇත. දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල අලුතෙන් මිල දී ගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම නිසා පරණ එන්ජින් ධාවනය කිරීමට සිදු වී ඇත. ඒවාට වැය වෙන ඉන්ධන ප්‍රමාණය ඉතා ඉහළයි.

මීට විසඳුමක් ලෙස දුම්රිය සේවයට ආදරය කරන ජනතාවගේ සහයෝගය මතින් දුම්රිය සේවය දියුණු කිරීමට අපේක්ෂා කරනවා. ඒ අනුව පෙර ගෙවුම් දුම්රිය ප්‍රවේශ පත් හඳුන්වා දෙනවා. ඒ අනුව මගීන් හට පහසු අවස්ථාවක දුම්රිය ප්‍රවේශ පත්‍ර මිල දී ගත හැකි අතර, දුම්රිය වේදිකාවට ප්‍රවේශ වන ස්ථානයේ දී දින මුද්‍රාව සටහන් තබනු ලැබේ.

තවද දුම්රිය සේවය අලාභ ලැබීමට ප්‍රධාන හේතුව ගමන් වාර හයක මුදලට මාසික වාර ප්‍රවේශ පත්‍ර (සීසන්) නිකුත් කිරීමයි.

මෙය රාජ්‍ය සේවය ගමට ගෙන යාමට බලවත් බාධාවක් වී ඇත.

ඇතැම් අවස්ථාවල මගීන් දවසට පැය හයක් පමණ සමාජ මාධ්‍ය තුළ කාලය විනාශ කරයි.

ඒ අනුව 2026 වර්ෂයේ සිට මාසික වාර ප්‍රවේශ පත්‍ර(සීසන්) වෙනුවට පෙර ගෙවුම දුම්රිය ප්‍රවේශ පත්‍ර හඳුන්වා දෙනු ලැබේ.

ගරු කථානායකතුමනි,

5. දුම්රිය මැදිරි සමාජ පන්ති අහෝසි කිරීම.

බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කළ දුම්රිය පන්ති ක්‍රමය වෙනස් කිරීමට කාලය පැමිණ ඇත.

දෙවන පංතිය සහ තුන් වන පන්තිය මැදිරිවල සුවිශේෂී වෙනස්කම් දක්නට නොමැත. එකම දුම්රිය, එකම දුම්රිය මාර්ගය, එකම ගමනාන්ත වේලාව සඳහා ගාස්තු කිහිපයක් පැවතීම විකෘතියකි.

එක දුම්රියක එක් පන්තියක මැදිරි පමණක් සවි කිරීමට යෝජනා කරමි. ඒ අනුව මන්දගාමී දුම්රිය, සීඝ්‍රගාමී දුම්රිය, නගරාන්තර දුම්රිය, අධිසුඛෝපභෝගී දුම්රිය වශයෙන් මින් ඉදිරියට වර්ග කෙරේ. මෙම ක්‍රමය 2026 මාර්තු 01 වන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

ගරු කථානායකතුමනි

6. පැරණි මිල සඳහන් දුම්රිය ප්‍රවේශ පත්‍ර.

ඇතැම් දුම්රිය ස්ථාන මගින් නිකුත් කරන ප්‍රවේශ පත්‍ර පැරණි මිල සඳහන් ඒවා බවට පැමිණිලි ලැබී ඇත. මේ දක්වා මුද්‍රණය කර ඇති දුම්රිය ප්‍රවේශ පත්‍ර හරහා යම් යම් අක්‍රමිකතා සිදු වන බව විගණන වල දී හෙළි වී තිබෙනවා.

මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා ටිකට් පත පිටුපස නව අංකයක් මුද්‍රණය කර 2026 මාර්තු 1 සිට නිකුත් කිරීමට නියම කරනවා. සියළුම දුම්රිය ස්ථාන, සියළුම ගමනාන්ත සඳහා අදාළ ප්‍රවේශ පත්‍ර අලුතෙන් මුද්‍රණය කරන අතර ඊට වැය වන මුදල දුම්රිය දෙපාර්තමේන්තුවේ ආයෝජනයක් ලෙස විග්‍රහ කළ හැකියි.

දුම්රිය ප්‍රවේශ පත්‍ර පත් මුද්‍රණය කිරීම සඳහා රජයේ මුද්‍රණාලයට රුපියල් බිලියන එකක් වෙන් කිරීමට යෝජනා කරනවා. එමගින් දුම්රිය පාඩුව සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට අපේක්ෂා කරනවා. (කොහොමද වැඩේ?)

ගරු කථානායකතුමනි,

7. පාසල් නිල ඇඳුම්.

පාසල් නිල ඇඳුම් සුදු වර්ණයෙන් යුතු වීම නිසා දෙමව්පියන්ට විශාල මුදලක් වැය කිරීමට සිදු වී තිබෙනවා. ඉතා කෙටි කලකින් අවපැහැ ගැන්වීම නිසා භාවිතයෙන් ඉවත් කිරීමට සිදු වෙනවා. ඇඳුම් කිලිටි කර ගෙන පැමිණෙන ළමුන්ට දෙමව්පියන්ගෙන් විවිධ තාඩන පීඩන වලට ලක් වීමට සිදු වී තිබෙනවා. මේ හේතුව නිසා ළමුන් පාසලේ දී උකටලී ව සිටීමට පුරුදු වී සිටිනවා. දරුවන්ගේ ක්‍රියාශීලී වයසේ දී මෙසේ සිටීම නිසා අනාගතයේ දී සියලු කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමට සිදු වෙනවා.

මෙය ඉතා අයහපත් තත්ත්වයක්.

මීට විසඳුමක් ලෙස පාසල් නිල ඇඳුම් සඳහා දුඹුරු වර්ණය මා යෝජනා කරනවා. නැතිනම් වෙනත් වර්ණයක් මේ ගරු පාර්ලිමේන්තුව යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

විශ්ව විද්‍යාල කාර්මික විද්‍යාල තෘතීය අධ්‍යාපන ආයතන සඳහා සුදු වර්ණ සහිත නිල ඇඳුම් එලෙසින් ම පවත්වා ගෙන යාම සුදුසු යැයි මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි,

8. වීදි පහන් ආලෝකකරණය.

වීදි පහන් ආලෝකකරණයේ දී බරපතළ විදුලි නාස්තියක් සිදු වන බව නිරීක්ෂණය වනවා. දහවල් කාලයේ දීත් වීදි පහන් දැල්වී තිබීම, විදුලි කාන්දු සිද්ධ වීම ඊට හේතුවයි.

මෙය වැළැක්වීම සඳහා සෑම පළාත් පාලන ආයතනයකට ම රාත්‍රියේ දී ස්වයංක්‍රීය ව වීදි පහන් දැල්විය හැකි පරිපථ 5000 බැගින් බෙදා දීමට යෝජනා කරනවා. එමගින් විදුලි බුබුලක ආයු කාලය ද වැඩි කර ගැනීමට හැකියාව ලැබෙනවා. මෙම ඒකකයක් රු.200/-ක් වන අතර

වැය කිරීමට බලාපොරොත්තු වන මුදල රුපියල් මිලියන 339කි. එමගින් වසරකට ඉතිරි කර ගත හැකි විදුලිය ඒකක ගණන මෙගාවොට් 148ක් වන අතර එහි වටිනාකම රුපියල් බිලියන 3.7කි.

ගරු කථානායකතුමනි,

9. රාජ්‍ය ආදායම ඉහළ නැංවීම.

බොහෝ රාජ්‍ය ආයතනවල මුදල් භාර ගැනීම සවස තුනෙන් පසු අත්හිටුවන ලැබේ. අතීතයේ දී බැංකු පාරිභෝගික ගනුදෙනු ක්‍රියාත්මක වූයේ සවස තුන දක්වා පමණක් වීම ඊට හේතුවයි. නමුත් මේ වන විට මුදල් තැන්පතු යන්ත්‍ර සෑම නගරය කම ස්ථාපිත බැවින් කාර්යාලීය වෙලාව අවසන් වන තුරුම මුදල් භාර ගැනීම සිදු කිරීමට යෝජනා කරමි. මීට අමතරව කාඩ් පත් මගින් හා කිව් ආර් කේත මගින් මුදල් ගෙවීමේ පහසුකම් ජනවාරි එක සිට ක්‍රියාත්මක වනු ඇත. එමගින් රාජ්‍ය ආදායම සීයට දෙසීයක වර්ධනයක් අපේක්ෂා කෙරේ.

ගරු කථානායකතුමනි,

10. ශබ්ද දූෂණ බදු.

අධිබලැති ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් සිදු වන ශබ්ද දූෂණය සහ එමගින් ඇතිවෙන රෝගාබාධ සඳහා වැය වන සෞඛ්‍ය පිරිවැය ඉතා අධිකයි. එබැවින් මෙය පාලනය කිරීම සඳහා පැයකට ඩෙසිබල් එකක් සඳහා රුපියල් දාහක් අය කිරීමට යෝජනා කරමි. පොලිසිය සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක අනුමැතියට යටත්ව පළාත් පාලන ආයතන විසින් අදාළ ගාස්තු අය කරනු ඇත.

එමගින් අපේක්ෂිත බදු ආදායම රුපියල් බිලියන 16 කි.

ගරු කථානායකතුමනි,

11. සෞඛ්‍ය පිරිවැය අඩු කිරීම.

ජාතික සෞඛ්‍ය සඳහා වැය කරන මුදල අඛණ්ඩව වැඩි කළ ද නිරෝගිමත් දේශයක් නිර්මාණය කිරීමට තවමත් හැකියාව ලැබී නැහැ.

මාර්ග දෙපස ආපනශාලා විශාල වශයෙන් වර්ධනය වුවද වැසිකිළි පහසුකම් ඊට සාපේක්ෂව වර්ධනය වී නැහැ. මළ මුත්‍රා පහ කිරීමට සුදුසු වැසිකිළි කැසිකිලි ස්ථාන නො තිබීම හේතුවෙන් අඩුවෙන් ජලය පානය කිරීමට මගීන් හුරුවී තිබෙනවා. මේ හේතුවෙන් බොහෝ රෝගාබාධ තත්ත්වයන් උද්ගත වී ඇත.

මීට විසඳුමක් ලෙස සෑම බස් නැවතුම් ස්ථානයකට ම එක් වැසිකිළියක් බැගින් නිර්මාණය කිරීමට මා යෝජනා කරනවා. ඒ සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට රුපියල් බිලියන දෙකක් වෙන් කරනවා. කෙසේ වෙතත් මෙය ප්‍රවාහන වියදම් ශීර්ෂයට එකතු වනු ඇත.

ගරු කථානායකතුමනි,

12. රාජ්‍ය සේවය පිණිසයි.

නිදහසෙන් පසු රාජ්‍ය සේවය තෘප්තිමත් කිරීම සඳහා ගන්නා ලද සියලු උත්සාහයන් අසාර්ථක වී ඇත. වැටුප් කෙතරම් වැඩි කළ ද ඊට අනුරූපී ව  බැංකු ණය ලබා ගන්නා බැවින් නිරතුරු ආර්ථික අපහසුතා දාමයක රාජ්‍ය සේවකයා වෙළී සිටී.

කළ යුත්තේ කුමක් ද?

1. රාජ්‍ය සේවකයන් සඳහා බැංකු ණය ලබා දීම වහාම නතර කළ යුතු අතර, ඔවුන් ඇපකරුවන් වීමද තහනම් කළ යුතුයි.
2. රජයේ සේවකයන්ගේ වැටුපෙන් අඩු කර ගන්නා බැංකු ණය වාරික, ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඊට අදාළ  පොලිය රජය විසින් අදාළ බැංකු වෙත ගෙවීමට යෝජනා කරමි.
3. එවිට ලැබෙන සම්පූර්ණ වැටුප රාජ්‍ය සේවකයා තෘප්තිමත් කරයි. එවිට අල්ලස් හා දූෂණ වෙත යොමු වීමට සිදු නොවේ.
4. මෙය 2026 මාර්තු 1 සිට නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන අතර ඉන් පසු වර්ෂ වල දී ක්‍රියාත්මක කිරීම හෝ බොල්ණය ලෙස සම්පූර්ණ ණය මුදල කපා හැරීමට හෝ අපේක්ෂා කෙරේ.
5. මේ මගින් පෞද්ගලික ව්‍යවසායකයින් සඳහා ණය ලබා දීමට බැංකු පෙළඹවීම තවත් අරමුණකි.

   පොහොසත් බැංකු, දුප්පත් මිනිස්සු වෙනුවට පොහොසත් දියුණු රටක් හදමු.

   ස්තුතියි.

චක්ඛුන් උදපාදි - විජ්ජා උදපාධි,

ඥානා උදපාදි- ආලෝකෝ උදපාදි